මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය

-------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 16 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014අප්‍රේල් 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 07 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
-----------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශන ඉදිරිපත්කර තිබූ නමුත් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංශ 2 අනුව නිසිපරිදි පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරන අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු විගණන ගාස්තුව වන රු. 16,000 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයන් වන ඡායා පිටපත් යන්ත්‍ර අළුත්වැඩියාව, රබර් මුද්‍රාව, ක්‍රිකට් පන්දු මිලදී ගැනීම් වෙනුවෙන් වැයකරන ලද රු. 34,170 ක් ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාව සතුව මෝටර් වාහන විස්සක් තිබුණද, එම වාහනවල වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.

(ඇ) විදුලි බුබුළු මිලදී ගැනීම සඳහා වැය කරන ලද රු. 189,078 ක් ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් ගත කර තිබුණි.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්

----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලෙජරය අනුව 2014 දෙසැම්බර් 31 වන දිනට සේවක ණය ශේෂය රු. 2,619,676 ක් වුවද, සේවක ණය ලේඛනය අනුව එදිනට ශේෂය රු. 2,776,184 ක් වුයෙන් රු. 156,507 ක වෙනසක් විය.

(ආ) තැන්පත් ලේඛනය අනුව 2014 දෙසැම්බර් 31 වන දිනට තැන්පත් ශේෂයේ රු. 6,327,793 ක් වුවද, කේවල තැන්පත් ගිණුම්වල එකතු ශේෂය රු. 5,372,260 ක් වුයෙන් රු. 955,532 ක වෙනසක් විය.

(ඇ) අත්තිකාරම් ලේඛනය අනුව 2014 දෙසැම්බර් 31 වන දිනට අත්තිකාරම් ශේෂය රු. 11,483,632 වුවද, කේවල අත්තිකාරම් ගිණුම්වල එකතු ශේෂය රු. 48,286 විමෙන් රු. 1,435,346 ක වෙනසක් විය.

1.3.4 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවය හැර ගිය සහ මියගිය නිලධාරින් දෙදෙනකුගෙන් අයවියයුතු ණය ශේෂය රු. 189,947 ක් වර්ෂ තුනක සිට හිඟව පැවතියද, එය අයකර ගැනීම සඳහා 2015 ජුලි 10 වනි දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) ග්‍රාම සංවර්ධන සමිතිවලට භාර දෙන ලබා කොන්ත්‍රාත් 13 ක් 2010 වර්ශයේ නිම කර තිබුණද, රඳවා ගැනීම මුදල වන රු. 35,200 ක් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ පහත දැක්වෙන අයිතමයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| අයිතමයන් | වටිනාකම | ඉදිරිපත් නොවු සාක්ෂි |
|---|---|---|
| | රු | |
| ගබඩා තොග | 102,009 | ගබඩා ලේඛනය සහ සමික්ෂණ මණ්ඩල වාර්තා |
| සේවක ඇප තැන්පත් | 2,650 | ඇප ලබාගත් සේවකයන් පිළිබඳ විස්තර |

1.3.6 නීති, රීති හා රෙගුලාසි සනාදියට අනුකූල නොවීම

---------------------------------------------------------

පහත සඳහන් නීති, රීති වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | |
| (i) පරිච්ඡේදය 1 වගන්තිය 5 (XII) | මුදල් සහ ගබඩා ද්‍රව්‍ය කටයුතු පරිපාලනම වශයෙන් නිලධාරින් හතර දෙනෙකුට භාරදී තිබුනද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය III වගන්තිය 81 | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද, අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයෙදී සභාව විසින් ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දින අවසන් වර්ෂයේ පුනරාවර්තික වියදම් ඉක්මවූ ආදායම් රු. 8,426,849 ක් විය, ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය රු. 2,972,227 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙන් රු. 5,454,622 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 වරිපනම් හා බදු

-----------------

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම්, ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලි සඳහා 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

------------------------------

(අ) මුද්දර ගාස්තු

--------------

රෙජිස්ටාර් ජනරාල් වරයාගෙන් 2010 වර්ෂයයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා ලැබියයුතු මුද්දර ගාස්තු රු. 8,997,026 ක් වුවත්, එම මුදලින් රු. 6,441,411 පමණක් ලැබී තිබුණි. හිඟ මුදලවන රු. 2,555,615 රෙජිස්ටාර් වරයාගෙන් ලබා ගැනීමට සභාව විසින් මෙතෙක් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ලැබියයුතු මුද්දර ගාස්තු | ලැබුණු මුද්දර ගාස්තු | හිඟ |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2010 | 731,901 | 580,251 | 151,650 |
| 2011 | 1,792,260 | 1,558,388 | 233,872 |
| 2012 | 1,854,094 | 1,596,518 | 257,576 |
| 2013 | 2,283,321 | 1,957,816 | 325,505 |
| 2014 | 2,335,450 | 748,438 | 1,587,012 |
| | 8,997,026 | 6,441,411 | 2,555,615 |

(ආ) උසාවි දඩ මුදල්

------------------

2014 වර්ෂයට අදාල හිඟ උසාවි දඩ මුදල් රු. 473,100 ක් අයකරගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ දුර්වලතා

-----------------------------

(අ) 2012 දෙසැම්බර් මාසයේ සිට හඳුනා නොගත් ලැබීම් ලෙස රු. 41,500 ක් බැංකු සැසඳුම් ප්‍රකාශයේ දිගටම පෙන්වා තිබුණද එවා හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ සේවකයන්ගේ වැටුප් ගෙවීම්වලින් 2014 වර්ෂයේ අයකරගත් මුද්දර ගාස්තු රු. 6,200 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකර තැන්පත් ගිණුමේ ගිණුම්ගතකර තිබුණි.

(ඇ) 2010 සැප්තැම්බර් 01 දින හා අංක 446 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව ප්‍රාදේශ සභාවේ ලේකම්වරයාගේ මාසික දුරකථන ගාස්තු ප්‍රමාණ රු. 4,000 ට සීමා කර කිබුණද සමාලෝචිත වර්ෂයේදී ඔහුගේ දුරකථන ගාස්තු වශයෙන් රු. 73,959 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. කෙසේ වුවද, ඔහුගේ දුරකථන ගාස්තු වශයෙන් වැඩිපුර ගෙවන ලද රු. 25,929 ක මුදල වැටුපෙන් අයකර ගැනීම සඳහා මෙතෙක් කටයුතුකර නොතිබුණි.

3.2 නිෂ්ක්‍රීය වත්කම්

------------------

(අ) 2011 වර්ෂයේදී පරිත්‍යාගයක් වශයෙන් ‘USAID’ආයතනයෙන් ලබාදී තිබූ ‘Roller’ යන්ත්‍රය අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකිරීම නිසා සභාවේ වාහන අංගනයේ නවතා තිබූ බව 2015 ජුනි 23 දින පවත්වන ලද විගණන පරික්ෂණයේදී නිරීක්ෂණයවිය.

(ආ) පොදු වෙළද පොළ ගොඩනැගිලි සංකීර්ණයේ තිබෙන කඩකාමර 12 කින් කඩ කාමර 03 ක් බදු දීම සඳහා කටයුතු නොකිරීම නිසා 2012 ජනවාරි සිට 2015 ජූලි 10 දක්වා නිෂ්ක්‍රියව තිබුණි.

4 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) ආදායම් පරිපාලනය